**ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය සහ එහි පරිපාලිතය - 2013**

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2013 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත සහ 1991 අංක 28 දරන සංශෝධිත පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාලිත සමාගමේ ගිණුම් විගණනය කරන ලද්දේ එහි සාමාජිකයන් විසින් පත්කරන ලද වරලත් ගණකාධිකරණ ආයතනයකිනි. මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්, විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

---

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1** තත්ත්වාගණනය කළ **මතය - ආයතනය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

තත්ත්වාගණනය කළ **මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

දේශීය ආදායම් පනත ප්‍රකාරව 2009/10 වර්ෂයේ ගෙවිය යුතු බදු බැර රු.189,830,059 ක මුදල ගෙවීමට හෝ ඒ වෙනුවෙන් ගිණුම්වල වෙන්කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් තිදෙනෙකුගේ පැමිණීම සහ පිටවීම සහතික කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස රු.8,888,576 ක් ගෙවා තිබූ අතර එය සනාථ කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ නවීකරණ කටයුතු කිරීමේදී ගලවා ඉවත් කරන ලද අබලි භාණ්ඩ වටිනාකම තක්සේරු කර නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනතේ 3(2) (iii) වගන්තිය | සියළු ලැබීම් හා ලැබිය යුතු ආදායම් මත ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කළ යුතු වුවද ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් මුදලින් ලද පාඨමාලා ගාස්තු මත පමණක් ගණනය කිරීම් සිදුකර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| 261(3) | මුදල් පොතෙහි ප්‍රමාණවත් මුදල් නොමැතිව ගෙවීම් සටහන් කිරීම හෝ චෙක්පත් ලිවීම නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,829,156 ක් වටිනා චෙක්පත් සටහන් කිරීම් නිසා එම අගයෙන් මුදල් පොතේ ශේෂය සෘණ අගයක් වී තිබුණි. |
| **(ඇ)** 2009 **අප්‍රේල්** 16 **දිනැති අංක** 09/2009 **දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | ආයතන ප්‍රධානී ඇතුළු සියළුම නිලධාරීන් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කළ යුතුය. තවද කාලය පදනම් කරගෙන ගෙවනු ලබන අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහාද එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. |
| **(ඈ) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන චක්‍රලේඛයේ - 7.4.5 වගන්තිය** | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| **(ඉ) 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ** | |
| (i) 3.2 වගන්තිය | රු. 3,337,588 වැයකර නව පරිගණක මෘදුකාංග පද්ධතිය මිලදී ගැනීමේදී ආයතනය විසින් ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙන් බැහැරව කටයුතු කර තිබුණි. |
| (ii) 4.3 වගන්තිය | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර එකවර මිල කැඳවීම් සිදුකර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත සහ එහි සංශෝධනයන්ට අනුව පිහිටුවනු ලැබූ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ අධ්‍යක්ෂ තනතුර හා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයේ පීඨාධිපති වශයෙන් ආයතන දෙකක තනතුරු දෙකක කටයුතු කිරීමට එක් පුද්ගලයෙකුට ඇති නීත්‍යානුකූල හිමිකාරිත්වය කුමක්ද යන්න විගණනයට තහවුරු නොවුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ ශුද්ධ ලාභය රු. 250,164,789 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.217,785,460 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 32,379,329 ක වර්ධනයක් වූ අතර පාඨමාලා ආදායම වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනයට හේතුවී තිබුණි.

### 3.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් ආදායම, පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 31 කින් වැඩි වී තිබූ අතර බදුවලට පසු ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 19 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. මූල්‍ය වියදම 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 423 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

### 3.3 තෝලන අනුපාතය

ජාතික කළමනාකරණ විද්‍යායතනයේ ස්කන්ධ ප්‍රාග්ධනය රු.814,344,261 ක් වූ අතර ණය ප්‍රාග්ධනය රු.1,417,524,425 ක් විය.ඒ අනුව තෝලන අනුපාතය (ණය /ස්කන්ධ ප්‍රාග්ධනය) 1.74 ක් වශයෙන් අධිතෝලන තත්වයක් දක්නට ලැබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය වර්ෂ 5 ක් තුළ පවත්වන ලද පාඨමාලා හා බඳවාගත් සිසුන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | ඵලදායීතා හා කළමනාකරණ සංවර්ධන අංශය | | කළමනාකරණ තොරතුරු පද්ධති අංශය | |
|---|---|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව |
| 2009 | 166 | 4697 | 59 | 3513 |
| 2010 | 183 | 7014 | 61 | 3941 |
| 2011 | 184 | 7282 | 72 | 4141 |
| 2012 | 174 | 7008 | 71 | 3739 |
| 2013 | 193 | 7450 | 71 | 3504 |

ඉහත තොරතුරු අනුව කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා සංඛ්‍යාව වෙනස් නොවී තිබියදී බඳවා ගත් සිසුන් සංඛ්‍යාව අඩුවී තිබුණි.

(ආ) මෙහෙයුම් ආදායම

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මෙහෙයුම් ආදායම බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සමඟ සසඳා පහත දැක්වේ.

| වර්ෂය | මෙහෙයුම් අදායම (රු.) | මෙහෙයුම් ආදායමේ වෙනස රු. | වෙනස් වීම ප්‍රතිශතයක් ලෙස සියයට | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාවේ වෙනස | වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස සියයට |
|---|---|---|---|---|---|---|
| 2009 | 357,778,605 | - | - | 8480 | - | - |
| 2010 | 511,155,236 | 153,376,631 | 42.9 | 10955 | 2475 | 29.2 |
| 2011 | 721,860,817 | 210,705,581 | 41.2 | 11423 | 468 | 4.3 |
| 2012 | 569,075,984 | (152,784,833) | (21.2) | 10787 | (636) | (5.6) |
| 2013 | 678,487,780 | 109,411,796 | 19.2 | 10954 | 167 | 1.5 |

2012 වර්ෂයේදී උපාධි පාඨමාලා අනුබද්ධිත ආයතනයේ පැවැත්වූ නිසා මෙහෙයුම් ආදායම අඩුවී තිබූ අතර ආයතනයේ මුළු ආදායම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය එය වන බවත් නිරීක්ෂණය විය.

## 4.2 මතභේදයට තුඩුදෙන කරුණු

2011 නොවැම්බර් 17 දිනැති අංක ඊසී/4/1254/11 දරන ආයෝජන මණ්ඩල ලිපියේ 6 වන ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය පිහිටුවීමේ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අළුත් ව්‍යාපාරයක් විය යුතු බවත්, පවතින ව්‍යාපාරය ප්‍රතිව්‍යුහගත කිරීමක් හෝ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරයක සම්පත් මාරු කිරීමක් නොවිය යුතු බවත් දක්වා තිබුණි. නමුත් ආයතනයේ පාලන අධිකාරිය විසින් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයෙහි වාහන, අධ්‍යයන කාර්ය මණ්ඩලය හා උපාධි පාඨමාලා ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යායතනයට ලබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය .

## 4.3 හඳුනාගන්නා ලද පාඩු

ආයතනයේ ගොඩනැගිලි නවීකරණය කිරීමේදී පැරණි ජනෙල් දොරවල් ආරක්ෂාකාරීව ගලවා ඉවත් කිරීම වෙනුවෙන් රු. 89,775 ක් ගෙවා තිබුණි. ඉවත්කරන ලද දැව ප්‍රමාණයන් හා වටිනාකම් පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබූ අතර, ඉවත් කරන භාණ්ඩ ආයතනයට වාසිදායක ලෙස අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ 2013 වර්ෂය සඳහා වූ සංශෝධනය කළ ඒකාබද්ධ ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2014 ජූලි 24 දිනදීය.

**5.2 ගිණුම් කටයුතුභාවය**

2003 ජුනි 02 දිනැති පීඊඩී අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ප්‍රකාශයට පත්කරන ලද වාර්ෂික වාර්තාවල නිවැරදි සංඛ්‍යා දත්ත ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

සංශෝධිත අයවැය ලේඛනය හා සත්‍ය වියදම් අතර වැය විෂයන් 26 ක වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ දුර්වලතා වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) පාඨමාලා පැවැත්වීම
(ඇ) මානව සම්පත් කළමනාකරණය